# රජගල ආරාම පරිශ්‍රයේ භූ දර්ශනය සහ එහි ජෛව විවිධත්වය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ගුණවර්ධන. ඩී.ඒ.එම්.පී,[1] ප්‍රේමරත්න ජී.ඩී.ඩබ්.[2] විතානාච්චි. සී.ආර්,[3]*

භූ දර්ශනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් ප්‍රදේශයක භූ පිහිටීමේ ස්වරූපය වන අතර ජෛව විවිධත්වය යනු යම් කිසි භූ කලාපයක දක්නට ලැබෙන පාරිසරික විවිධත්වයකි. ඉහත ප්‍රස්තුතය සම්බන්ධයෙන් සුවිශේෂීතාවක් නැගෙනහිර පළාතේ අම්පාර රජගල තැන්න ආශ්‍රිත කලපයේ හඳුනාගත හැකි විය. මෙම ආරාම සංකීර්ණය පිහිටා තිබෙන මෙම කඳුගැටය නැගෙනහිර පළාතේ ගල් ඔය ශේෂ කඳුවලින් නිමග්න වූවක් ලෙස සැලකේ. ප්‍රධාන වසයෙන් රජගල කඳු පර්වතයේ භූ දර්ශනය ස්වභාවික හා සංස්කෘතික ලෙස සකස් වී ඇත. ව්‍යවහාරයේ රජගල කන්ද ලෙසින් හැඳින්වෙන මෙය මුහුදු මට්ටමේ සිට අඩි 1038ක් පමණ උසකින් යුක්ත ය. සමස්ත කඳු පර්වතයෙහි ව්‍යාප්තිය දළ බෑවුම් හා මඳ බෑවුම් සහිත ස්වභාවික භූ දර්ශනයකින් ද කඳු මුදුන තැනිතල ස්වරූපයකින් ද යුක්ත වේ. ගල් ඔය ශේෂ කඳු පන්තිය ප්‍රධාන වසයෙන් ග්‍රැනයිට් පාෂාණයෙන් සකස් වී ඇත. එම පාෂාණ බෙහෙවින් ජීරණයට ලක් ව ඛාදනයට ලක් වී ඇති බව නිරීක්ෂණය වේ. ආරාමික ප්‍රරිශ්‍රයක් ලෙස ගොඩනැඟීමට පූර්වයෙන් මෙම භූමිය විවිධ මානව ක්‍රියාකාරක්ම් පැවතී භූ ඛණ්ඩයක් බව ශේෂ ව පවතින මානව ක්‍රියාකරකම්වල සාධක අනුසාරයෙන් නිගමනය කළ හැකි වේ. ඓතිහාසික ජනාවාස ගොඩනැඟීමට පෙර ප්‍රාග් ඓතිහාසික මානවයා ගල්ලෙන් සිය වාසස්ථාන බවට පත් කරගෙන ඇති නමුත් ඒ සඳහා භූගෝලීය දේශගුණික හා පාරිසරික සාධක බලපා ඇත. රජගල කඳු ප්‍රදේශය ආශ්‍රිත ව ස්වභාවික කුඩා ජල මාර්ග කිහිපයක් පවතී. ස්වභාවික ගල් කෙවෙනි තුළ ද වර්ෂයේ වැඩි කාලයක් ජලය රැඳී තිබෙනු දැකගත හැකි වේ. ආරාම සංකීර්ණය ආශ්‍රිත පරිසරයේ මිල්ල, දඹ, මාදං, වීර, හල්මිල්ල, නා, වෙලන්, රුක් අත්තන, යකඩමරන්, කලු මැදිරිය, කළු කෝන්, ගල් සියඹලා වැනි ඝන ශාක වැස්මක් පවතී. යටි ශාක වැස්මෙහි ඉලුක්, පතොක්, මානා, එරමිනියා වැනි ශාක ගහණයකින් යුත් ශාක ව්‍යාප්තියක් දක්නට ලැබේ. තෘණ වර්ග හා පුස්වැල් ආරාම පරිශ්‍රයේ පැරණි ගොඩනැගිලි නටඹුන් ආශ්‍රිත ව බහුල ව පවතී. සිවුපාවුන්, උරග විශේෂ හා ආගන්තුක පක්ෂි වර්ග ද සත්ත්ව ප්‍රජාව ආශ්‍රිත ප්‍රජාව ලෙස වසර මුළුල්ලේ දැකගත හැකි අතර ඇතැම් කාලවල වැසි සමයේ පමණක් සක්‍රීය වන ස්වභාවික ඇළ මාර්ගවලින් පෝෂණය වන ඇතැම් පොකුණුවල ගල් හඬියා, මඩකරියා, දණ්ඩියා වැනි සුළු මත්ස්‍ය විශේෂ ජීවත් ව සිටිති. මෙම පර්යේෂණ සඳහා ප්‍රධාන වසයෙන් උපයෝගී කරගනු ලැබූ ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රියාවලියයි. මීට අමතර ව ප්‍රදේශවාසීන් සමඟ කල සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද වැදගත් තොරතුරු අනාවරණය කරගැනීමට හැකි විය. ආරාම සංකීර්ණයේ මෙම භූ දර්ශණ පරිශ්‍රයේ පිහිටුවාලීමට උපයෝගී වූ භූ දර්ශණය සහ පාරිසරික තත්ත්වය අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම කඳු ගැටය ආශ්‍රිත භූ දර්ශනය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි විශේෂත්වය වන්නේ ස්වභාවික ලෙන් රාශියක් මෙම ස්ථානය ආශ්‍රිත ව පිහිටා තිබීම ආරම්භක අවධියේ දී මෙහි සංඝාරාම ගොඩනැගීම කෙරෙහි ප්‍රධාන වසයෙන් බලපාන්නට ඇති බව ය. මෙහි භූ පිහිටීම නිසා ඇති වන සිසිල් පාරිසරික තත්ත්වය බෙහෙවින් භාවනානුයෝගී භික්ෂූන් සඳහා සුදුසු වටපිටාවක් පවතින්නට ඇති බවට සිතිය හැකි ය. ස්වභාවික ජල මාර්ග ආශ්‍රිත ව සකසා තිබෙන කෘත්‍රිම ජල සම්පාදන ක්‍රියාවලිය තුළින් පරිසරයෙන් ලැබෙන ජලය කළමනාකරණය කළ ආකාරය හඳුනාගැනීමට හැකි ය. බොහෝ පැරණි ආරාම සංකීර්ණ ආශ්‍රිත ව දක්නට ලැබෙන තවත් විශේෂත්වයක් වන ඉහළ විහිදෙන ස්වභාවික ගල් තලාවක් මෙම පරිශ්‍රයේ දැකගත හැකි වේ. එවැනි ස්ථාන පදනම් කරගනිමින් ස්තූප ඉදිකිරිම සිදු කොට ඇත. ඒ අනුව රජගල අරාම සංකීර්ණය පිහිටුවීමෙහි ලා සංජානනය වී ඇත්තේ එහි සුවිශේෂී භූ දර්ශනය හා ජෛව විවිධත්වය බව පැහැදිලි ය.

***ප්‍රමුඛ පදඃ*** රජගල, ජෛව විවිධත්වය, භූ ලක්ෂණ, ශේෂ කඳු

[123] පුරාවිද්‍යාව සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
pereramaduwanthi615@gmail.com